බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වී තිබුණු පුස්තකාල පොත් 82 ක ඌනතාවයට අදාල වටිනාකම් අයකර ගැනීමට හෝ ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර රු.22,000 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ විෂයයන් 02 ක ඌනතාවය ගිණුම් වල ගැලපීම් කර නොතිබුණි.

(ආ) ලී බඩු හා සවිකිරීම් ගිණුමේ ශේෂය හා ඊට අදාල උපලේඛන ශේෂය අතර වෙනස නිවැරදිව හඳුනාගෙන ගැලපීමකින් තොරව ජර්නල් සටහන් මගින් රු. 271,371 ක් ලීබඩු උපකරණ ගිණුමට බැර කොට හා සමුච්චිත අරමුදල් ගිණුමට හර කොට තිබුණි.

(ඈ) ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීම ගිණුමේ ශේෂය වූ රු. 74,335,530 ක් හා ස්ථාවර වත්කම් ගිණුම්වල එකතුව වූ රු. 73,664,340 ක් අතර රු. 671,190 ක් වූ වෙනස නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල මධ්‍යම රජය හා පළාත් සභා ප්‍රතිපාදන යටතේ රු. 53,011,073 ක සංවර්ධන කටයුතු සිදුකර තිබුණද එය මූල්‍ය හා මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ ආදායම් හා වියදම් ලෙස ගිණුම්ගත කොට නොතිබුණි.

(ඉ) 2015 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව මුද්දර ගාස්තු වශයෙන් රු.2,036,012ක් සභාව වෙත ලැබීමට නියමිතව තිබුණු නමුත් රු. 1,468,937 ක් පමණක් ලැබියයුතු ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා ණය ගැතියන් රු.567,075 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පුනරාවර්තන ස්වභාවයේ අලුත්වැඩියා, නඩත්තු හා සැපයුම් සේවා වියදම් එකතුව රු.1,340,148 ක් ප්‍රාග්ධන වැය විෂයයන් 4 ක් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(උ) ප්‍රාග්ධන වැය විෂයයන් 5 කට අදාළ රු. 2,599,484 ක් නියමිත වත්කම් ලේඛනවල සටහන් කර ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමට හා නියමිත වත්කම් ගිණුම්වලට ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් නිරීක්ෂණය කරන ලද දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා 2015 වර්ෂයට ගෙවිය යුතු පොලිය වූ රු. 249,753 ක් ගිණුම්ගත නොකිරීමේ බලපෑම ගලපා නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 2,661,249 ක් වූ අතර ඊට අදාළ උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.2,255,691 ක් වූයෙන් වෙනස රු. 405,558 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව පිළිවෙලින් රු.2,538,288 ක් හා රු.1,854,066 ක් විය.

1.4 නීති,රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | --------------------------- | --------------------- |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) | මු.රෙ. 371 | 2012 සැප්තැම්බර් සිට ලබාගෙන තිබුණු එකතුව රු.69,038 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2017 අප්‍රේල් 25 දින වනවිටත් පියවා නොතිබුණි. |
| (ආ) | මු.රෙ. 571 | 2011 වර්ෂය සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාල එකතුව රු. 1,678,856 ක් වූ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

--------------------

2.1 මූල්‍ය ප්‍රතිපල

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,443,871 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.582,054 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපලයේ රු.2,861,817 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,861,817 ක වර්ධනයට ආදායම් විෂයයන් 04 ක වැඩිවීම හා වියදම් විෂයන් 04 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | | 2016.12.31 දිනට හිඟය | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිඟය | 2016.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම | 2016.01.01 දිනට පැවති හිඟයෙන් හිග | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 188 | 113 | 1,064 | 902 | 75 | 162 | 237 |
| (ii) බදු කුලී | - | - | 393 | 393 | - | - | - |
| (iii) බලපත්‍ර ගාස්තු | - | - | 150 | 150 | - | - | - |
| (iv) වෙනත් ආදායම් | - | - | 9,269 | 10,139 | - | (870) | (870) |
| එකතුව | 188 | 113 | 10,876 | 11,584 | 75 | (708) | (633) |

(ආ) සභාව විසින් ලබාදුන් තොරතුරු අනුව, වරිපනම් හා බදු වලින් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු. 237,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. 201,600 ක් විය.

2.3.2 වරිපනම්

-----------

සභාවට අයත් වරිපනම් දේපල 2009 වර්ෂයේදී යටියන්තොට ප්‍රාදේශීය සභාවෙන් පවරා ගෙන තිබුණු අතර මෙම දේපල නැවත තක්සේරු කිරීමට හා වරිපනම් ගාස්තු සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 වෙනත් ආදායම්

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිසර ආරක්ෂණ බලපත්‍ර

------------------------------

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 08 කට අදාලව බලපත්‍ර ලබාගෙන නොතිබුණ අතර ඒ සම්බන්ධයෙන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපාර බදු

---------------

ව්‍යාපාර ආයතන 14 කට අදාලව සමාලෝචිත වර්ෂයට ව්‍යාපාර බදු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ආදායම්

---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/ 8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව බල ප්‍රදේශය තුළ ඉදිකරනු ලබන දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා උස මීටර් 5 – 20 අතර රු. 20,000 ක් හා වැඩිවන සෑම මීටරයකටම රු.100 බැගින් වන පෙරසැරි ගාස්තු හා සංවර්ධන බලපත්‍ර ගාස්තු අයකළයුතු වුවත් ප්‍රදේශය තුළ ඉදිකර තිබුණු කුළුණු සම්බන්ධ සමීක්ෂණයක් කර ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) දුරකථන සම්ප්‍රේෂණ ආයතන වලින් වාර්ෂික ව්‍යාපාර බදු මුදල් රු.3,000 බැගින් අයකර ගතයුතු වුවද ප්‍රදේශය තුළ වූ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 03 ට අදාලව රු.9,000 ක් අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-----------------

බුලත්කොහුපිටිය නගරයේ සතිපොල භූමිය සංවර්ධනය කිරීම 2014 ජනවාරි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට වෙත පවරා තිබුණද 2017 මැයි වන විටත් එම සතිපොල ඉදිකිරීම් නිමකර නොතිබුණි. තවද සතිපොල පැවැත්වීම සඳහා සතිපොල පැවැත්වෙන දිනකට රු. 5,000 බැගින් ගෙවා භූමියක් කුලියට ගැනීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු. 720,000 ක් වැයකර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පැරණි ගම්සභා උසාවි ගොඩනැගිල්ල නඩු තීන්දුවක් මගින් 2015 වර්ෂයේදී අත්පත් කරගෙන රු. 3,180,000 ක වටිනාකමකට ගිණුම්ගත කර තිබුණද එම වටිනාකම සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ආ) 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ රු. 21,469,814 ක ඇස්තමේන්තුවක් මත ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණි. 2017 මාර්තු 01 දින ආදාහනාගාරයේ ඉදිකිරීම් නිමකර සභාව වෙත භාරදී තිබුණද අදාළ මාර්ග සංවර්ධනය ඇතුළු පොදු පහසුකම් සංවර්ධනය නොකිරීම හේතුවෙන් ආදාහන කටයුතු ආරම්භකර නොතිබුණි.

(ඇ) රු. 59,700 ක් වූ සේවක ඇප තැන්පතු මුදල් එක් එක් නිලධාරීන්ගේ පාස් පොත්වල තැන්පත් කිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයනොවී පැවති එකතුව රු. 52,930 ක් වූ සේවක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) තනතුරු වර්ග 07 කට අදාළව සේවක පුරප්පාඩු 8 ක් පැවතියද බඳවාගැනීම් කර නොතිබුණි.

3.3 හඳුනාගත් අලාභ

------------------

උඩුව පන්සල අනාථ කඳවුරට වැසිකිළි පහසුකම් සැපයීම සඳහා වූ වැසිකිළි ඉදිකිරීමේ කර්මාන්තයේදී ඉටු නොකල වැඩ විෂයයන් 03 ක් සඳහා රු. 9,563 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු.4,506,739 ක් හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා රු.650,306 ක් වශයෙන් රු.5,157,045 ක වැය සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු අතර කොම්පෝස්ට් ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේදී රු.3,360 ක ආදායමක් උපයා තිබුණි. 2017 අප්‍රේල් වනවිට කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 1,514 ක් සඳහා රු.15,140 ක ආදායමක් උපයා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

1988 මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

4.2 අයවැය පාලනය

2016 අයවැය ලේඛනය මගින් වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදන වලින් අවස්ථා 06 කදී එකතුව රු. 8,325,000 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබුණු අතර වැය විෂයන් 12 කට අදාලව සියයට 62 සිට සියයට 96 දක්වා වූ පරාසයක එකතුව රු.104,841,013 ක් උපයෝජනය කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් නිරීක්ෂිත කරුණු සමාලෝචිත වර්ෂයේදී නිවැරදි නොකිරීම |
| | | (ii) මෝටර් රථ හා යන්ත්‍රසූත්‍ර වෙන් වෙන්ව ගිණුම්ගත නොකිරීම |
| | | (iii) ජර්නල් සටහන් වල සංලක්ෂ පැහැදිලි නොවීම |
| | | (iv) ඉඩම් හා ගොඩනැගිලි සඳහා ලේඛන නඩත්තු නොකිරීම |
| (ආ) | වත්කම් පාලනය | (i) වත්කම් තක්සේරුකර ගිණුම්ගත නොකිරීම |
| | | (ii) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක වීම ප්‍රමාදවීම |
| (ඇ) | මුදල් හා බැංකු | බැංකු සැසඳුමේ නිරවුල් නොකල ශේෂ පැවතීම |
| (ඈ) | ආදායම් පාලනය | (i) සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන තිබුණද දේපල තක්සේරු කර වරිපනම් අය නොකිරීම |
| | | (ii) හිඟ ආදායම් පැවතීම |